# විසිවන සියවස පාලි සාහිත්‍යය සංවර්ධනයට බලපෑ සාධක විමර්ශනයක්

මොනරාගල නන්දසිරි හිමි[1]

තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කිරීමට භාවිතා කළ මාධ්‍ය භාෂාව වශයෙන් සලකනු ලබන්නේ පාලි භාෂාව ය. තථාගත ධර්මය ව්‍යාප්තවීමත් සමඟම ලෝකයේ විවිධ දේශ දේශාන්තරවල ව්‍යාප්ත වූවා සේ ම මෙම භාෂාව මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩමවීමෙන් ශ්‍රී ලංකාවෙහි ද ව්‍යාප්ත විය. මෙම භාෂාව මුල් කරගෙන නිර්මාණය වූ සාහිත්‍යය පාලි සාහිත්‍යය නම් වේ. විවිධ යුගවල නිර්මාණය වූ හේතූන් මත මෙම පාලි සාහිත්‍යය පිරිහීමට පත් වූ අතර සමහර යුගවල සංවර්ධනයට ද පත් විය. පාලි සාහිත්‍යයෙහි ස්වර්ණමය කාලපරිච්ඡේද තුනකි.

අනුරාධපුර යුගයේ සිට පොළොන්නරුව යුගය අවසානය දක්වා කාලපරිච්ඡේද

මහනුවර යුගයෙහි සංඝරාජ සමඟ බැඳුනු කාලපරිච්ඡේද

විසිවන සියවසයෙහි අවසන් දසක හතරක කාලපරිච්ඡේද

වශයෙනි. මෙම කාලපරිච්ඡේද අතුරෙන් පළමු හා දෙවන කාලපරිච්ඡේදවල අට්ඨකථා, ටීකා, වංසකථා, ව්‍යාකරණ, ඡන්දස්, අලංකාර සහ නිඝණ්ඩු ආදී සාහිත්‍යාංග බිහි වූ අතර පාලි සාහිත්‍යයේ ස්වර්ණමය කාලපරිච්ඡේදයක් වශයෙන් සලකනු ලබන විසිවන සියවසයෙහි භක්ති කාව්‍යය, චරිතකථා කාව්‍යය, මහා කාව්‍යය සහ උපදේශ කාව්‍යය ආදී විවිධ සාහිත්‍යාංග බිහිවීම නිසා මෙම කාලපරිච්ඡේදය ස්වර්ණමය යුගයක් බවට පත් විය. අනෙක් කාලපරිච්ඡේදයන්හි ලොකෝත්තරත්වය ම අරමුණු කරගෙන ග්‍රන්ථ නිර්මාණය වුව ද විසිවන සියවස තුළ ලොකෝත්තරත්වය ඉක්මවා ගිය වෙනත් අරමුණු ද මුල් කරගෙන ග්‍රන්ථ රචනා වූ බව විචාර පූර්වකව විමසා බැලීමෙන් ප්‍රකට වේ. මෙම විසිවන සියවස නූතන කොළඹ යුගය වශයෙන් ඇතමෙකු හඳුන්වනු ලැබේ. මෙම කාලපරිච්ඡේදය ක්‍රි: ව: 1900 සිට ක්‍රි: ව: 2000 දක්වා කාලය වේ. මෙම යුගයෙහි පාලි සාහිත්‍යය සංවර්ධනය වෙනුවෙන් බල පෑ සාධක වන්නේ 19 වන සියවසේ අග භාගයේ දී සිදු වූ විවිධ ක්‍රියාකාරකම් සහ විසිවන සියවසයෙහි සිදු වූ සිදුවීම් කිහිපයකි. එනම්,

විශිෂ්ට පඬිවරු බිහිවීම

නිකායන්හි පාර්ශව භේදය ව්‍යාප්ත වීම

අධ්‍යාපන ක්‍රමය ක්‍රමවත් වීම

විවිධ විශිෂ්ට විද්‍යාස්ථාන බිහිවීම

විදේශ සම්බන්ධතා තහවුරු වීම

ප්‍රාචීන භාෂෝපකාර සමාගම බිහිවීම

රජයත් සමඟ පිරිවෙන් ඍජු සම්බන්ධතා පැවැත්වීම

මෙම හේතු සාධක පාලි සාහිත්‍යයෙහි සංවර්ධනයට ඍජුව ම හෝ වක්‍රව කෙතෙක් දුරට බල පැවේදැයි යන්න විමසා බැලීම මෙහිලා අපේක්ෂිත අරමුණ විය.

**ප්‍රමුඛ පද**- පාලි සාහිත්‍යය, යුග, කාලපරිච්ඡේද, විසිවන සියවස, සංවර්ධනය

---

1 B.A. (Hons ) M.A .(Kel), Royal Pundit (O.S.S)
Email: monaragalan@gmail.com